ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**University of Sri Jayewardenepura**

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

**External Degrees and Extension Courses Unit**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>My Number | } | USJP/EEX-05/2025 | ලිපිනය<br>Address | } | තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල<br>Post Box 10, Gangodawila |
| ඔබේ අංකය<br>Your Number | } | | | | නුගේගොඩ, ශ්‍රී ලංකා<br>Nugegoda, Sri Lanka , |
| දුරකථනය<br>Telephone | } | 011-2801481, 0113-485402 | වෙබ් අඩවිය<br>Website | } | www.external.sjp.ac.lk |
| ෆැක්ස්<br>Fax | } | 011-2802753 | විද්‍යුත් තැපැල<br>E-mail | } | exams.edecu@sjp.ac.lk |


2025.12.31

ප්‍රිය ශිෂ්‍ය/ශිෂ්‍යාවනි

## පුනර් අපේක්ෂකයින් සඳහා විභාග අයදුම්පත් කැඳවීම - 2026

## වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි III පරීක්ෂණය (නව විෂය නිර්දේශය) 2018/2019/2020/2021 පුනර් කණ්ඩායම් සඳහා

ඉහත පුනර් පරීක්ෂණයට අයදුම් කිරීමට සහ පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා පහත උපදෙස් අනුගමනය කරන ලෙස දන්වා සිටිමි.

<table>
<tr><td>පරීක්ෂණය සඳහා අයදුම් කිරීම</td><td>ඔබගේ තොරතුරු ගොනුව (Student Profile) වෙත පිවිස Examination හි ඇති Application Repeat වෙත පිවිස නැවත පෙනී සිටීමට අපේක්ෂා කරන විෂයයන් නිවැරදිව තෝරා යොමු කළ යුතු වේ. මාර්ගගත ක්‍රමවේදය හරහා අයදුම්පත් යොමු කළ (Apply) පසු ඔබ ඉල්ලුම් කළ පුනර් පරීක්ෂණයට අදාළ තොරතුරු Student Profile හරහා පරීක්ෂා කළ හැක.</td></tr>
<tr><td>පුනර් පරීක්ෂණ ගාස්තු ගෙවිය යුතු ගිණුම් අංකය ලබා ගැනීම</td><td>පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා ඔබට අදාල ගිණුම් අංකය ඔබගේ තොරතුරු ගොනුව (Student Profile) වෙත පිවිස Student හි ඇති Payments මගින් ලබා ගත හැක. ඕනෑම මහජන බැංකු ශාඛාවකින් හෝ මාස්ටර්/වීසා (Master/ Visa) (Credit හෝ Debit Card) මගින් ගෙවීම් කළ හැක.<br><br>(සැලකිය යුතුයි: ගිණුම් අංකය ලබා ගැනීමේදී අනිවාර්යයෙන් Reason for the payments නිවැරදිව තෝරා ගත යුතුය)</td></tr>
<tr><td>පුනර් පරීක්ෂණ ගාස්තු</td><td>විෂයයන් 1ක් සඳහා රු. 5,000.00<br>විෂයයන් 2ක් සඳහා රු. 7,000.00<br>විෂයයන් 3ක් සඳහා රු. 9,000.00<br>විෂයයන් 4ක් සඳහා රු. 11,000.00<br>විෂයයන් 5ක් සඳහා රු. 13,000.00<br>විෂයයන් 6ක් සඳහා රු. 15,000.00</td></tr>
<tr><td colspan="2">2025 මැයි පවත්වන ලද උපාධි III පරීක්ෂණයට අයදුම් කර වෛද්‍ය හේතු මත විභාගයට වරප්‍රසාද ලැබූ 2021 වර්ෂයේ ලියාපදිංචි අපේක්ෂකයන්ද පරීක්ෂණ ගාස්තු ගෙවීම අනිවාර්ය වේ.</td></tr>
<tr><td>අයදුම්පත් යොමු කළ යුතු අවසාන දිනය</td><td>2026 ජනවාරි 23 (රාත්‍රී 12.00 දක්වා)</td></tr>
</table>

<table>
<tr><td>ලියාපදිංචිය දීර්ඝ කිරීම</td><td rowspan="5">ලියාපදිංචිය දීර්ඝ කිරීම පිලිබඳ විස්තර www.external.sjp.ac.lk වෙබ් අඩවියේ සහ ඒ සඳහා මුදල් ගෙවිය යුතු ගිණුම් අංකය (Student Profile) වෙත පිවිස (Student) හි ඇති Payments මගින් ලබා ගත හැක. ඕනෑම මහජන බැංකු ශාඛාවකින් හෝ මාස්ටර්/වීසා (Master/ Visa) (Credit හෝ Debit Card) මගින් ගෙවීම් කළ හැක.<br>(ගෙවීම් කරන ලද රිසිට් පත සහ ශිෂ්‍ය වාර්තා පොත තැපැල් මගින් එවීම අවශ්‍ය නොවන අතර ගිණුම් අංකය ලබා ගැනීමේදී අනිවාර්යයෙන් Reason for the payments නිවැරදිව තෝරා ගත යුතුය))</td></tr>
<tr><td>2018 වර්ෂයේ ලියාපදිංචි සිසුන්<br>2025-09-30 දිනට වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය<br>(ලියාපදිංචිය වාර 4 ක් අලුත් කර තිබිය යුතුය)</td></tr>
<tr><td>2019 වර්ෂයේ ලියාපදිංචි සිසුන්<br>2025-08-31 දිනට වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය<br>(ලියාපදිංචිය වාර 3 ක් අලුත් කර තිබිය යුතුය)</td></tr>
<tr><td>2020 වර්ෂයේ ලියාපදිංචි සිසුන්<br>2025-08-31 දිනට වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය<br>(ලියාපදිංචිය වාර 2 ක් අලුත් කර තිබිය යුතුය)</td></tr>
<tr><td>2021 වර්ෂයේ ලියාපදිංචි සිසුන්<br>2026-01-31 දිනට වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය<br>(ලියාපදිංචිය වාර 1 ක් අලුත් කර තිබිය යුතුය)</td></tr>
</table>

සැලකිය යුතුයි

I. **2018 අධ්‍යයන වර්ෂයේ ලියාපදිංචි සිසුන් හට උපාධි III පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැකි අවසන් අවස්ථාව මෙය වේ .**

II. පරීක්ෂණ අයදුම්පත් යොමු කිරීමට ප්‍රථම පාඨමාලා ගාස්තු දෙවන හා තෙවන වාරිකය ද අදාළ පරිදි ලියාපදිංචිය දීර්ඝ කිරීමේ ගාස්තුද සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ. එසේ ගෙවා නොමැති අයදුම්කරුවන්ට පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

III. අයදුම්පත් යොමු (Apply) කිරීමේ අවසන් දිනය 2026/01/23 **(රාත්‍රී 12.00 දක්වා)** වන අතර එම දිනයෙන් පසුව කිසිදු හේතුවක් මත අයදුම්පත් භාරගනු නොලැබේ.

IV. පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා එක් අයදුම්කරුවෙකු වෙනුවෙන් සුවිශේෂී ගිණුම් අංකයක් බැගින් ඇති අතර අදාළ ගිණුම් අංකයට පමණක් ගෙවීම් කළ යුතුය. ගාස්තු ගෙවීම, දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් සිදුකළ හැක. (ගෙවීම් කරන ලද රිසිට් පත ළඟ තබාගත යුතු අතර වෙනත් ගිණුම් අංක වලට ගෙවන ලද මුදල් පිළිබඳව විශ්වවිද්‍යාලය වග කියනු නොලැබේ.)

V. නියමිත පරිදි මුදල් නොගෙවන ලද අයදුම් කිරීම් නැවත දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

VI. පරීක්ෂණයට අදාළ කාල සටහන **www.external.sjp.ac.lk** යන බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවියෙහි පල කරන අතර සියළු දැනුවත් කිරීම් වෙබ් අඩවිය/ශිෂ්‍ය තොරතුරු ගොනුව (Student Profile) හරහා පමණක් සිදු වේ.

VII. විදේශ ගත සිසුන් සඳහා අයදුම්පත් ඉදිරිපත් කර මාර්ගගත ක්‍රමය ඔස්සේ පෙනී සිටිය හැක. ඒ සඳහා වන විස්තර **http://external.sjp.ac.lk/online-exminations-for-migrated-students/** යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

VIII. නියමිත දිනට ඉහත පරීක්ෂණය සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කළ සිසුන්ගේ විභාග ප්‍රවේශපත්‍රය ඔබගේ තොරතුරු ගොනුව (Student Profile) වෙත පිවිස Examination හි ඇති Admission වෙත පිවිස බාගත Download කර ගත හැක. විභාග ප්‍රවේශපත්‍ර තැපැල් මාර්ගයෙන් නිකුත් නොකරන බව කාරුණිකව සලකන්න.

IX. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය 428 වන සනාතන සභාව විසින් අනුමත කරන ලද සංශෝධිත නව විභාග නීති රීති මාලාව **external.sjp.ac.lk/bachelor-of-science-management-public-general-external-degree-exam-rules-and-regulations/** වෙත පිවිස පරිශීලනය කල හැක.

X. **උපාධියක් සම්පූර්ණ කිරීම :** උපාධිය ලැබීම සඳහා අවශ්‍යතාවන් පිළිබඳ විස්තර **www.external.sjp.ac.lk** වෙබ් අඩවියේ පල කර ඇති ඔබගේ අධ්‍යයන වර්ෂයට අදාළ ශිෂ්‍ය විවරණිකාව (Prospectus) පරිශීලනය කිරීමෙන් ඔබට ලබා ගත හැකිය.

XI. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 09/2021 අනුව ඔබට අදාල උපාධි සහතිකය සහ විස්තරාත්මක ප්‍රතිඵල ලේඛනය නිකුත් කරනුයේ ඔබ විසින් බාහිර උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේදී ඉදිරිපත් කරන ලද උප්පැන්න සහතිකයේ සඳහන් නමට පමණි. ඒ අනුව මේ සමග ඇති අයදුම් පත්‍ර අංක 1 නිවැරදිව සම්පූර්ණ කර උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපතක් සමඟ, නියෝජ්‍ය ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැපැල් පෙට්ටිය අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට 2026 ජනවාරි 23 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ.



නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2025.12.31